# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/5 - 2013 ජනවාරි මස 15 වැනි අඟහරුවාදා - 2013.01.15

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 ඇ වගන්තිය යටතේ නියමය

2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනය I මගින් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ 2013.01.15 දින සිට නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් වන බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

2012.02.27 වැනි දිනැති අංක 1747/1 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2013 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

#### උපලේඛනය I

1. පහත සඳහන් කාණ්ඩවලට අයත් ආනයනය කරන ලද මෝටර් රථ / භාණ්ඩ :–

(අ) විදේශ දූත මණ්ඩලයන්හි සේවය කරන ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන් විසින් 2000.04.07 දිනැති අංක 165 දරන විදේශ අමාත්‍යාංශ චක්‍රලේඛය හා එයට කරන ලද සංශෝධන වලට අනුකූලව ආනයනය කරනු ලබන මෝටර් රථ ;

(ආ) ශ්‍රී ලංකා රජය විසින් විදේශීය සංවිධාන හා විදේශීය රාජ්‍යයන් සමග එළඹී ඇති නොයෙකුත් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ ;

(ඇ) රාජ්‍ය සේවකයකු විසින් 1999.10.08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එයට යා කරන ලද සංශෝධනවලට අනුකූලව ආනයනය කරනු ලබන මෝටර් රථ ;

(ඈ) අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන පරිදි රට වෙනුවෙන් විශිෂ්ට සේවාවක් ඉටු කරන ලද කිසියම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන හෝ එබඳු පුද්ගලයන්හට පරිත්‍යාග වශයෙන් ලැබෙන වාහන ;

(ඉ) ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැඳුම්කරයක මුල් අයිතිකරුවන් විසින් භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයන්ට අනුකූලව සහනදායී බදු යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ ;

1A - PG 001537 — 885 (2012/02)

2. රජයේ විශේෂ නියෝග යටතේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ආපදා හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අදාළ විශේෂ නියෝගවලට අනුකූලව ආනයනය කරනු ලබන භාණ්ඩ.

3. කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත 30% කට නොඅඩු දේශීය එකතු කළ අගයක් සහිතව අළුත් වාහන උපාංග යොදා ගනිමින් දේශීයව එකළස් කළ / නිෂ්පාදිත වාහන. එහෙත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 87.03 ට අනුව, මෙම නිදහස් කිරීම අයිතම (3)හි අදාළ කොන්දේසිවලට යටත් ව, II වැනි උපලේඛනයෙහි දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතට ගැනෙන වාහනවලට පමණක් අදාළ වේ.

4. කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත 30% කට නොඅඩු දේශීයව එකලස් කළ හෝ එකතු කළ අගයක් සහිතව මෙරට එකතු කළ නිෂ්පාදනය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 84 සහ 85 කාණ්ඩයන්ට අයත් වන භාණ්ඩ.

5. රේගු ආඥාපනතේ 107 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ ඇති මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීම්) රෙගුලාසි යටතේ තීරු බදු රහිතව නිශ්කාෂණය කර ගැනීමට හිමිකම් ලබන සෑම භාණ්ඩයක් ම.

6. නැව් ගබඩා බඩු ලෙස පාවිච්චි කිරීම සඳහා ප්‍රතිඅපනයනය කිරීම පිණිස බන්ධිත ගුදමින් නිශ්කාෂණය කරනු ලබන සෑම භාණ්ඩයක් ම.

7. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර යම් අපනයනකරුවෙකු වෙත සපයනු ලබන සෑම භාණ්ඩයක් ම, එම නිෂ්පාදනය කරන ලද භාණ්ඩය අපනයනය කරන ලද බවට නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ලියකියවිලි ඉදිරිපත් කරන්නේ නම් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත එවැනි භාණ්ඩ.

8. භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යටත්ව, ලියාපදිංචි අවමංගල්‍ය සේවා සපයන්නන් විසින් ආනයනය කරනු ලබන අවමංගල්‍ය රථ.

9. ඒකාබද්ධ අරමුදල් උපයෝගී කර ගනිමින් රජයේ ආයතන විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත මූල්‍ය කල්බදු හෝ සෘජුව මිලදී ගැනීම මගින් ආනයනය කරනු ලබන හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන මෝටර් රථ.

10. 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ පළමුවන උපලේඛණයේ II කොටසේ (ඊ) 2 ඡේදයේ දක්වා ඇති පරිදි රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභය සැළකිල්ලට ගෙන, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් හඳුනා ගන්නා ලද සහ රජය විසින් බදු ගෙවිය යුතු යම් විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන වාහන.

11. රාජ්‍ය සේවකයෙකු විසින් 2010/01 දරන වෙළෙඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය හා එයට යා කරන ලද සංශෝධනවලට අනුකූලව අදාල නිශ්චිත සහනයක් සහිතව ආනයනය කරනු ලබන මෝටර් රථ

12. පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු/නියෝජ්‍ය ප්‍රධානියෙකු පළාත් පාලන සහ පළාත් සභා 2011/01 දරන චක්‍රලේඛයට හා එයට යා කරන ලද සංශෝධනවලට අනුකූලව අදාල නිශ්චිත සහනයක් සහිතව ආනයනය කරනු ලබන මෝටර් රථ

13. ගුවන් තොටුපල විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව, ගුවන් තොටුපළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් නිකුත් කරනු ලැබූ ගුවන් මගීන් ගුවන්තොටුපල වෙත සහ ගුවන්තොටුපළින් ප්‍රවාහනය කිරීම සඳහා වන වලංගු අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එම කාර්යය සඳහා භාවිතා කරමින් තිබෙන වසර 5 කට වඩා පැරණි මෝටර් රථයක් වෙනුවට එම කාර්යය සඳහා යොදා ගැනීමට ආනයනය කරනු ලබන සිලින්ඩර් ධාරිතාවය ඝණ සෙන්ටිමීටර් 1500ට නොඅඩු, අළුත්ම (Brand New) මෝටර් රථයක් ආනයනයේදී ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණයෙන් 60%ක් හා භාවිතා කළ මෝටර් රථයක් ආනයනයේදී ගෙවිය යුතු මුළු බදු ප්‍රමාණයෙන් 50%ක් අඩුවන පරිදි ගෙවිය යුතු නිෂ්පාදන බදු ප්‍රමාණය අඩු කිරීම

උපලේඛනය **II**

පෙට්‍රල් වාහන :

| *ශීර්ෂ අංකය* (1) | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* (2) | *විස්තරය* (3) |
|---|---|---|
| **87.03** | | (87.02 ශීර්ෂයේ ඒවා හැර), ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව ප්‍රධාන වශයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා සැළසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන. |
| | 8703.21 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,000 නොඉක්ම වූ : |
| | | ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළුව, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර්. |
| | 8703.21.69 | අනෙකුත් |
| | 8703.22 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,000 ඉක්ම වූ එහෙත් ඝන සෙන්ටි මීටර් 1,500 නොඉක්ම වූ : |
| | | ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළුව, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර්. |
| | 8703.22.59 | අනෙකුත් |
| | | ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළුව, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 2,000 නොඉක්මවන, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | 8703.23.52 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,600 නොඉක්මවූ |

ඩීසල් වාහන :

| *ශීර්ෂ අංකය* (1) | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* (2) | *විස්තරය* (3) |
|---|---|---|
| | 8703.31 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,500 නොඉක්ම වූ : |
| | 8703.31.70 | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 2,000 නොඉක්මවන, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර් : |
| | 8703.32.51 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,600 නොඉක්මවන |
| | 8703.32.59 | අනෙකුත් |
| | | ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළුව, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 2,000 ඉක්මවන, අවුරුදු දෙකකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | 8703.32.71 | රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) 7 හෝ වැඩියෙන් ප්‍රවාහනය සඳහා ඉණිමඟක ආකාර වැසියකට ඇණ මුරිච්චි මගින් සවිකරන ලද ඒකීය බඳක් සහිත නොවූ නිබඳවම රෝද හතරම ඇන්ජිමෙන් කරකවනු ලැබිය හැකි සමස්ත දැරිය හැකි බර කිලෝ ග්‍රෑම් 800 ඉක්මවිය හැකි (පුද්ගලයින් හා භාණ්ඩ බර) වාහන |
| | 8703.32.79 | අනෙකුත් |

02 - 339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*